**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.04.11**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදූභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

නැත.

**සහභාගි වූ නිලධාරින් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.

02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**<u>ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.04.11 දින පැවති මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.</u>**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 අප්‍රේල් මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.04.11 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්,පිළිගැනීමෙන් අනතුරුව, න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

❖ 2022.03.15 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා</u>
ගරු මන්ත්‍රීතුමනි, 2022.03.15 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 මාර්තු මස 15 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමාගේ නිවේදන.**

නැත.

**03. සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරිම.**
**නැත.**

**04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.**
**නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05.01) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ලබාදීමට නියමිත පහත සඳහන් ඉඩම්වල මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත්,ඒ සඳහා සුදුසු මානක මහතෙකු නම් කිරීම සඳහාත්, අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

- **වැලිකඩයාය ක්‍රීඩා පිටිය**
- **නින්දගම්පැසැස්ස ක්‍රීඩා පිටිය**
- **රංචමඩම පොදු සුසාන භූමිය**
- **මානෙල් පෙදෙස පොදු සුසාන භූමිය**
- **වෑ අතුර පොදු සුසාන භූමිය**
- **වැලිකඩයාය පොදු සුසාන භූමිය**
- **මඩුවන්වෙල තලාව පොදු සුසාන භූමිය**

- **කොන්කටුව පොදු සුසාන භූමිය 1**
- **නින්දගම්පැලැස්ස පොදු සුසාන භූමිය**
- **කෝන්කටුව පොදු සුසාන භූමිය 2**
- **වළල්ගොඩ පැපොල්වතුයාය පොදු සුසාන භූමිය**
- **වළල්ගොඩ දබරයාය පොදු සුසාන භූමිය**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ලබාදීමට නියමිත ඉහත සඳහන් ඉඩම්වල මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත්,ජී.ඩබ්.කේ.මනම්පේරි මහතා යොදවා එම මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ගරු සභාපතිතුමණි,අපි මුල ඉඳලම කිව්වේ සභාව සතු ඉඩම්වල මැණුම් කටයුතු රජයේ මිණින්දෝරුවන් ලවා කරවන්න කියලයි.ඒකට හේතුව පෞද්ගලික මිණින්දෝරුවන්ට ඉඩම පුද්ගලිකද රජයේද කියලා අදාල නැහැ,පෙන්වන සීමාව විතරයි ඔවුන් මණින්නේ.අනිත් එක විරෝධතාවයක් ආවෝතින් මණින්නෙත් නැහැ.මොකද ඔවුන් කැමති නැහැ ගැටුමකට මැදිහත් වෙන්න.හරියට වැඩේ කෙරුනත් නැතත් මැණුම් ගාස්තු ගෙවන්න වෙනවා. ඒක සභාවට අවාසියක්.අනිත් එක ඉඩම් නිරවුල් කරන්නේ නැතුව පෞද්ගලික මිණින්දෝරුවන්ට මණින්න දෙන්න එපා.නිරවුල් ඉඩම් විතරක් දෙන්න.ඒ වගේම මැණුම් කටයුතු කරනකොට ඊට අදාල නිලධාරීන් අනිවාර්යයෙන්ම එතැනට යවන්න.ඒ වගේම සභාවෙත් සභාපතිතුමා,කොට්ඨාසෙ මන්ත්‍රීවරු වගේම නිලධාරීන් කිහිප දෙනෙකුත් යන්න.ඒ නිසා ගරු සභාපතිතුමණි,කලබල වෙන්නේ නැතුව හරියටම නිරවුල් කරලා ඉඩම් මණින්න.නැත්නම් ලොකු අවාසියක් වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමණි,මහවැලි අධිකාරියෙන් ඉඩමක් මණින්න, ආයතනයක් වශයෙන් අපි ඉල්ලීමක් කළාම ඒ ආයතනයෙන් කියනවා සුදුසුකම් ලත් මිණින්දෝරු මහත්තයෙකුගෙන් කැමැත්ත ගෙනත් දෙන්න කියලා.එහෙම කිව්වම ඒ මිණින්දෝරු මහත්තයා ලියුමක් ලියලා දෙනවා, අදාල ආයතනයට මේ මැණුම් කටයුත්ත කරන්න කැමතියි කියලා.ඊට පස්සේ එහෙන් නිලධාරියෙක් මුල් සිතියමත් අරගෙන එනවා, මායිම් පෙන්වන්න.එතකොට මායිම් ප්‍රශ්න මතු වෙන්නේ නැහැ.පිටස්තර කෙනෙකුට අයිතිවාසිකම් කියන්නත් බැහැ.ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන දෙකත් කටයුතු කරන්නේ මේ විදියටමයි.ඒ නිසා අපි ඉස්සෙල්ලා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට මේ ගැන දැනුම් දීල මේ ඉඩම් මණින්න අවසර ඉල්ලමු.

- **ඒ අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ලබාදීමට නියමිත ඉහත සඳහන් ඉඩම්වල මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත්,ජී.ඩබ්.කේ.මනම්පේරි මහතා යොදවා එම මැණුම් කටයුතු සිදු කිරීම සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය,උප කාර්යාල,පුස්තකාල හා ආයුර්වේද සඳහා ලිපි ද්‍රව්‍ය,කාර්යාලීය ද්‍රව්‍ය,සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ,විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය,උප කාර්යාල,පුස්තකාල හා ආයුර්වේද සඳහා ලිපි ද්‍රව්‍ය,කාර්යාලීය ද්‍රව්‍ය,සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ,විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය,උප කාර්යාල,පුස්තකාල හා ආයුර්වේද සඳහා ලිපි ද්‍රව්‍ය,කාර්යාලීය ද්‍රව්‍ය,සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ,විදුලි උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.03) 2022 මාර්තු මස 1,000,000.00 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2022 මාර්තු මස මෙම සභාවේ ලක්ෂ 10ට වැඩි වියදම් 01ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|
| 01 | 2022.03.24 | 347 | 787803 සිට 787818 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3505743.60 |
| එකතුව | | | | | | **3,505,743.60** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස රු:3,505,743.60ක් වූ ලක්ෂ 10ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.04) උඩවලව,පල්ලෙබැද්ද යන උප කාර්යාල සඳහා UPS යන්ත්‍ර 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

උඩවලව,පල්ලෙබැද්ද යන උප කාර්යාල සඳහා UPS යන්ත්‍ර 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව,පල්ලෙබැද්ද යන උප කාර්යාල සඳහා UPS යන්ත්‍ර 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.05) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් 2 කණුව සතිපොල භූමිය මිලදී ගැනීම පිළිබඳව තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් 2 කණුව සතිපොල භූමිය මිලදී ගැනීම පිළිබඳව තීරණයක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු මඩුවන්වෙල නින්දගම ඉඩමෙන් රූඩ් 03, පර්චස් 37.4ක ප්‍රමාණයක් කෝන්කටුව 02 කණුව සතිපොල භූමිය සඳහා විකිණීමේ පදනම මත ලබාදීමට එකඟතාවය ලැබී තිබෙනවා.ඒ අනුව

| | |
|---|---|
| 1998 වසරේ තක්සේරු වටිනාකම | රු:350,000.00 |
| තක්සේරු හා සේවා ගාස්තුව | රු: 2700.00 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු මුළු මුදල | රු:352,700.00 |

ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් 2 කණුව සතිපොල භූමිය මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් 2 කණුව සතිපොල භූමිය මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.06) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ලබාදුන් පල්ලෙබැද්ද දෙමටගල ඉඩමෙහි අධිකරණ කටයුතුවලට අදාල ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
පල්ලෙබැද්ද දෙමටගල පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබාදෙන ලද පර්චස් 37.21ක ඉඩම සඳහා 23 කණුව,දෙමටගල,කොළඹගෙආර ලිපිනයේ පදිංචි ඩබ්.සුමනසිරි පෙරේරා යන අය විසින් හිමිකාරිත්වය පිළිබඳව කොලඹ 12 ඇපිල් අධිකරණයේ නඩු කටයුත්තක් ආරම්භ කරල තිබෙනවා.ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව ප්‍රධාන වග උත්තරකරු බවට පත්කර ගොණු කර තිබෙන මෙම නඩුව සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතා එක් නඩු වාරයක් සඳහා රු:52,000.00ක මුදලකුත්, ඔහුගේ සහායක නීතිඥවරයා එක් නඩු වාරයකට රු:5,000.00ක මුදලකුත් අය කරනු ලබනවා.ඒ වගේම ලිඛිත දේශන සැකසීම සඳහා රු:15000.00ක මුදලක් අය කරනවා.මෙම නඩුව සමථයකට පත් වන තෙක් මෙම නඩුවට අදාල ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
ගරු සභාපතිතුමණි,මෙම නඩු කටයුතුවලට බොහෝ දුරට සහභාගී වෙන්නේ ලේකම්වරයා.මම දැක්කා අපේ වර්තමාන ලේකම්තුමා මේ නඩුවලට යන්නට පෙර දිනයේ බොහොම බරපතල මානසික පීඩනයකින් මෙම ලිපිගොණු අධ්‍යයනය කරනවා.ඒ නිසා ගරු සභාපතිතුමණි,මම අදහස් කරනවා, කවුරු හරි නිලධාරියෙක් සතියක්වත් මේ ලිපිගොණු හොඳට අධ්‍යයනය කරලා නඩුවට ඉදිරිපත් වෙනවා නම් හොඳයි.නැත්නම් අපරාදෙ

මේවට වියදම් වෙන මුදල්.ලේකම්තුමාට මේක තනියම භාර අරගෙන කරගෙන යන්න පුළුවන් නම් ගැටළුවක් නැහැ.කාර්ය බහුලත්වයත් එක්ක එතුමට මේක කරගෙන යන්න අමාරු බවක් මම දැක්කා.මේ නඩුවලින් අපි පරාද වුණොත් ඒක බොහොම අපරාධයක් වෙනවා.

මේ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපති සුරන්ත ජයලත් මහතාගේ හා ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදි.

- **ඒ අනුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව වෙත ලබාදුන් පල්ලෙබැද්ද දෙමටගල ඉඩමෙහි අධිකරණ කටයුතුවලට අදාල ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.07) ගෑස් මිල ඉහලයාම හේතුවෙන්, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 96 ආදාහනාගාරයේ ආදාහන ගාස්තු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම සභාවට අයත් ආදාහනාගාරය වෙනුවෙන් මිලදී ගන්නා 37.05Kg බරැති ලිට්රෝ ගෑස් සිලින්ඩරයක මිල නැවතත් ඉහල ගියා.මේ වන විට එම ගෑස් සිලින්ඩරයක නව මිල රු:17,188.00ක් වෙනවා.ඒ අනුව මේ වන විට ජල හා විදුලි බිල්ද ඇතුළුව එක් මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා වැය වන මුදල රු15,885.00ක් වෙනවා. දැනට අපි ආදාහනයක් සඳහා බල ප්‍රදේශය තුළ රු:9,000.00ක් හා බල ප්‍රදේශයෙන් පිටත රු:10,000.00ක් ලෙස ගාස්තු අය කරනවා.නමුත් මේ වන විට ගෑස් මිල ශීඝ්‍ර ලෙස ඉහලයාම නිසා මෙම ගාස්තු සංශෝධනය කිරීමට සිදුවෙනවා.ඒ අනුව බල ප්‍රදේශය තුළ රු:18,000.00ක මුදලක් හා බල ප්‍රදේශයෙන් පිටත රු:20,000.00ක මුදලක් ලෙස සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රත්නායක මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය</u>

ගරු සභාපතිතුමණි,මේ කාල වකවානුවේ ජනතාව දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දීල ඉන්නේ.මිනිස්සුන්ට ගෑස් නැහැ.ඉන්ධන නැහැ.බඩුමිල අහස උසට.ජනතාව පෝලිම්වල දුක් විඳිනවා.මේ අවස්ථාවේ ආදාහන ගාස්තු වැඩි කරන එක සුදුසු නැහැ.දැනටමත් අපි ආදාහනයක් සඳහා රු:8000.00ක මුදලක් අය කරනවා.සභාව පාඩු ලබනවා තමයි.ඒක මම පිළි ගන්නවා.හැබැයි ඒක මිනිස්සුන්ගේ වරදකින් වුණ දෙයක් නෙමෙයි.මේ යෝජනාවට මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රත්නායක මහතා</u>

ගරු සභාපතිතුමණි,එතුමිය කියන කතාව ඇත්ත.නමුත් මට හිතෙන්නේ අපි ප්‍රාදේශීය සභාවක් විදියට සභාවට වැටෙන්න දෙන්න බැහැ.ජනතාවට පීඩනයක් දෙන්න බැහැ කියලා යම් විදියකින් මේ ගාස්තු අඩු කරලා, රටේ ආර්ථිකය කඩා වැටුණු මොහොතක, ප්‍රාදේශීය සභාවක් විදියට නැගී සිටිමින් ප්‍රදේශයට සේවය කරන්න හදන වෙලාවක, සභාවක් වශයෙනුත් කඩ වැටුණොත් ප්‍රාදේශීය මට්ටමේ දේශපාලඥයෝ හැටියට අපි ලොකු අපහසුතාවයකට පත් වෙනවා.මේ ගෑස් ප්‍රශ්ණ,ඉන්ධන ප්‍රශ්ණ විසඳුණොත් යථා කාලෙදි අපි යෝජනාවක් දාල මේ ගාස්තු අඩු කරමු.සභාපතිතුමාට හැකියාවක් තියෙනව නම් සභාව කඩා නොවැටී මේ තත්ත්වයෙන් කරගෙන යන්න අපි එහෙම කරමු.එහෙම නැතුව සභාව දවසින් දවස බංකොලොත් වෙනව නම් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඒක බලපානවා.සභාවට හානියක් නොවන විදියට තීන්දුවක් ගන්න අවශ්‍යයයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මේ ගාස්තු වැඩි නොකර පවත්වාගෙන යන්න නම් සමහර විට බැකෝ ලෝඩර් යන්ත්‍රය හා මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදා මාර්ග සකස් කිරීම,කසල එකතු කිරීම වගේ අනෙක් අත්‍යාවශ්‍ය සේවාවන් කිහිපයක් නවත්වන්න වෙයි.ඒක එහෙම වෙනවමයි කියලා අපට ස්ථිරවම කියන්න බැහැ.සමහර විට එහෙම කරන්න වෙයි.මන්ත්‍රීතුමිය කියපු දේ හරි.අපිත් කැමති නැහැ ජනතාවට පීඩනයක් දෙන්න. නමුත් මේ ප්‍රශ්ණ දෙකම ජනතාවට තමයි බලපාන්නේ.ගෑස් මිල ඉදිරියට තව වැඩි වෙයිද දන්නේ නැහැ.දැන් වැඩි කළේ නැත්නම් ලොකු ගාණක් එක පාරටම වැඩි කරන්න වෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

ගරු සභාපතිතුමණි, ආදාහනාගාරය 2006 වසරේදී විවෘත කරද්දි අපි කිව්වේ මහජන සේවයක් විදියට දිගටම පවත්වාගෙන යමු කියලා.අද ඩොලර් මිලට සාපේක්ෂව ඉන්ධන මිලට සාපේක්ෂව ඒක ගණනය කරන්න හදනවා.රු:9,000.00ක් කියන්නෙත් මේ කාලෙ හැටියට සැලකිය යුතු ගාණක්.එක මෘත දේහයක් දවන්න යන්නේ ගෑස් සිලින්ඩර් දෙකයි.ඒ කියන්නේ ගෑස් කිලෝ විසිපහක් විතර.කරන්ට් බිල කියලා ලොකු ගාණක් යන්නේ නැහැ.අපි එදා ඒ තීන්දුව ගත්තේ ජනතාව ගැන හිතලා.පාරවල් හදන එක අත්‍යාවශ්‍ය දෙයක් නෙමෙයි.නමුත් ආදාහනයක් කියන්නේ අත්‍යාවශ්‍ය සේවාවක්.තෙල් පෝලිම්වල,ගෑස් පෝලිම්වල ඉන්නකොට මිනිස්සු මැරෙනවා.එහෙම වෙලා ආදාහනයට ගේනකොට එතනත් මිල වැඩි වුණාම තත්ත්වය හිතාගන්න පුළුවන්නේ.සභා සීමාව ඇතුලෙ බදු ගෙවන අය ඉන්නවා.එයාලට සුභ සාධන සේවාවක් විදියට තමයි මේක පවත්වාගෙන ගියේ.මේකෙන් අපි ලාභ ඉපැයුවේ නැහැ.මේ තීරණය ගැන දෙවරක් හිතන්න.ලොකු සිලින්ඩරේ මිලට නෙමෙයි යන ගෑස් ගාණට මිල ගණනය කරන්න.මේක වැඩි කළොත් කවදාවත් අඩු කරන්න බැහැ.පළාත් පාලන පනතෙ කොහෙවත් එහෙම නැහැ.ඒව ලේසි නැහැ.මේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළෙ ඉන්නෙ අහිංසක මිනිස්සු.වැඩි කරන්න නෙමෙයි අඩු කරන්නයි ඕන.කරුණාකරලා මේ යෝජනාව ඉවත් කරගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ගරු සභාපතිතුමණි,මේ ගාස්තු වැඩි කිරීම රටේ වර්තමාන තත්ත්වයත් එක්ක ප්‍රශ්නයක් තමයි.මේ අපි ආණ්ඩු පක්ෂයක් විදියට විවිධ අපහාසවලට ලක්වෙමින් යන මොහොතක්.මේ යෝජනාව දැක්කම මමත් මවිතයට පත්වුණා.නමුත් අපි සභාවක් විදියට යථාර්ථය අවබෝධ කරගෙන කටයුතු කළ යුතුයි.මම ඉතාම සතුටු වෙනවා මේ කාරණාව දේශපාලනීකරණය කර නොගෙන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේ යෝජනාව ස්ථිර කිරීම සම්බන්ධව.මේ සභාවේ සියළුම දෙනාගේ ගෞරවය මේ අවස්ථාවේදී එතුමට පුද කර සිටිනවා.උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා කියන්නේ හොඳ බුද්ධිමතෙක්. හොඳ දේශපාලනඥයෙක්.එතුමා දුර ගමනක් ආපු පුද්ගලයෙක්.එතුමා කාන්ති මන්ත්‍රීතුමිය ලවා මේ යෝජනාවට විරෝධතාවය ප්‍රකාශ කරලා නිකන් ඉඳියි කියලයි මම හිතුවේ.නමුත් එතුමත් මේ යෝජනාවට විරෝධතාවය ප්‍රකාශ කළා.ඒ එතුමලගෙ දේශපාලනය.ඒකට කාටවත් දොස් කියන්න බැහැ.රු:9000.00ට තිබෙන ආදාහන ගාස්තු රු18000.00 දක්වා වැඩි කළාට විරුද්ධ වුණේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි.මෙය මහත් ආන්දෝලනයකට ලක් වෙන්න පුළුවන්.අපි ගත්ත මේ තීන්දුව ගැන ඒ පක්ෂයේ නායකයන් මහත් සේ උදම් අනලා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව අප්‍රසාදයට ලක් කරන්න පුළුවන්.2006 සිට ජනතා මෙහෙවරක් විදියට පාඩු පිට හෝ අපි මේක පවත්වාගෙන ආවා.නමුත් මේ පවතින ආර්ථික තත්ත්වයත් සමග ඒ ගාස්තුව සුළු මුදලකින් අපි වැඩි කළා.උග්‍ර දරිද්‍රතාවයත් සමග ඒ ගාස්තුව වැඩි කරලා ජනතාවට මේ බර පැටෙව්වොත් අපට ලොකු අපවාදයක් එනවා.ඒ නිසා මම අදහසක් විදියට ඉදිරිපත් කරනවා, මේ රු:18,000.00ක ආදාහන ගාස්තුව රු:15,000.00ක මුදලකට නැවත සංශෝධනය කරන්න කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිත් රණතුංග මහතා</u>

ගරු සභාපතිතුමණි,අදහස් දෙකක් ඉදිරිපත් වුණ නිසා මත විමසුමකට යන්න වෙනවා.අපි මත විමසුමකට නොගිහින් හරියට හොයල බලලා තීන්දුවක් ගන්නා තෙක් මේ යෝජනාව ලබන සභා වාරයට කල් තියමු.එහෙම බැරි නම් සභාවට පාඩු නොගෙන මේ ආදාහන ගාස්තුව රු:18000.00ට වැඩි කරන්න.ඒ මුදලට වැඩි කරන්න බැරි නම් තිබුණ ගාස්තුවට තියෙන්න අරින්න.සභාවට පාඩු වෙනව නම් ඇයි 8,000.00ටම

තියෙන්න අරින්නේ.පාඩුව අවම කරන්න ගියාම කොයි හරි තැනකදි සභාව හිර වෙනවා. ගන්නව නම් මේක ලාභ ලැබෙන තැනටම ගන්න.නැත්නම් තියෙන ගාණ තියෙන්න ඇරල ජනතාවට සහනයක් ලබා දෙන්න.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ගෑස් මිල ඉහල යාම හේතුවෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 96 ආදාහනාගාරයේ ආදාහන ගාස්තු, බල ප්‍රදේශය තුළ රු:18,000.00ක මුදලක් හා බල ප්‍රදේශයෙන් පිටත රු:20,000.00ක මුදලක් අය කිරීම ලෙස සංශෝධනය කිරීමට කිහිප දෙනෙක් අකමැත්ත ප්‍රකාශ කළ නිසා එම ගාස්තුව නැවත බල ප්‍රදේශය තුළ රු:15,000.00ක මුදලක් හා බල ප්‍රදේශයෙන් පිටත රු:16,000.00ක මුදලක් ලෙස සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

ගරු සභාපතිතුමණි,අපි කියන්නේ මේ අවස්ථාවේ ආදාහන ගාස්තු වැඩි කරන්න එපා කියලයි.ආදාහන ගාස්තු වැඩි කරනවට අපි විරුද්ධයි.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මේ යෝජනාවට පක්ෂව සහ විපක්ෂව මත දෙකක් ඉදිරිපත් වී ඇති නිසා මත විමසුමකට යන්නට සිදු වෙනවා.

- **ගෑස් මිල ඉහලයාම හේතුවෙන්, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 96 ආදාහනාගාරයේ ආදාහන ගාස්තු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාවට පක්ෂව හා විපක්ෂව විවිධ මත ඉදිරිපත් වු හෙයින් ඡන්ද විමසීමක් සිදු කරන ලදි.**

➢ **මෙම යෝජනාවට පක්ෂව ඡන්ද ලබා දුන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩබ්.සුරන්ත වීරසිංහ මහතා
2. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩබ්.ඒ. අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රේණුකා ජීවානි මහත්මිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. සුජීත් ප්‍රේමලාල් මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්. සුනිල් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් වීරසිංහ මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා

➢ **මෙම යෝජනාවට විපක්ෂව ඡන්ද ලබා දුන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ. කාන්තිලතා මිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. උපුල් කිත්සිරි මහතා

➢ **මෙම යෝජනාවට අදළාව ඡන්ද දීමෙන් වැලකී සිටි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මිය

3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සීතා පද්මණී මිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.ජී.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මලික් මදුභාෂන මහතා

- **මෙම යෝජනාවට අදළාව ඡන්දය විමසන අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.ගයාන් මේනුක දිසානායක මහතා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී. චන්ද්‍රසිරි මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සුනිල් ශාන්ත මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා

- **මෙම දිනයේ නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නාම ලේඛනය**

නැත.

- **ඒ අනුව ගෑස් මිල ඉහලයාම හේතුවෙන්, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු 96 ආදාහනාගාරයේ ආදාහන ගාස්තු,**
  - **බල ප්‍රදේශය තුළ රු:15,000.00ක මුදලක් හා**
  - **බල ප්‍රදේශයෙන් පිටත රු:16,000.00ක මුදලක්**

**අය කිරීම ලෙස සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාවට පක්ෂව වැඩි ඡන්ද භාවිත වු බැවින් එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**05.08) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන එක්රුස් කරගෙන බෙදා හැරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් අතින් දරණ ලද වියදම් නැවත ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඉන්ධන හිඟය හේතුවෙන් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන එක්රුස් කරගෙන බෙදා හැරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් විෂය නිලධාරී විසින් අතින් දරණ ලද රු:8,070.00ක මුදල නැවත ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන එක්රුස් කරගෙන බෙදා හැරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් අතින් දරණ ලද රු:8,070.00ක මුදල නැවත ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.09) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මුල්ඇඩියාවල සතිපොලෙහි 2022.04.03 වන දින රු:22,479.50 බදු වාරික මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
රජය විසින් ඇදිරිනීතිය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් මුල්ඇඩියාවල සතිපොල පැවැත්වීමට නොහැකි වුණා. ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මුල්ඇඩියාවල සතිපොලෙහි 2022.04.03 වන දින රු:22,479.50 ක් වන බදු වාරික මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, රජය විසින් ඇඳිරිනීතිය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන්, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මුල්ඇඩියාවල සතිපොලෙහි 2022.04.03 වන දින රු:22,479.50 ක් වන බදු වාරික මුදල ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව කපා හැරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.10) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු MG 330 අංක දරණ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයේ ප්‍රෙෂර් රෙගියුලේටරය,ප්‍රෙෂර් වයර් කෝඩ් හා ප්‍රෙෂර් වැල් බොක්ස් අළුතින් සවි කර අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු MG 330 අංක දරණ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයේ ප්‍රෙෂර් රෙගියුලේටරය,ප්‍රෙෂර් වයර් කෝඩ් හා ප්‍රෙෂර් වැල් බොක්ස් අළුතින් සවි කර අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රත්නායක මහතා</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු MG 330 අංක දරණ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයේ ප්‍රෙෂර් රෙගියුලේටරය,ප්‍රෙෂර් වයර් කෝඩ් හා ප්‍රෙෂර් වැල් බොක්ස් අළුතින් සවි කර අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා විසින් සභාගත කරන ලද යෝජනා.</u>

**05.11) බණ්ඩොක්කයාය ගලමඩ මාර්ගයේ ජලනල ව්‍යාපෘතියක ජලනල ඇතිරීම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ලබා ගැනීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබා ගැනිමට අදාළ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් බණ්ඩොක්කයාය ගලමඩ මාර්ගයේ ජලනල ව්‍යාපෘතියක ජලනල ඇතිරීම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ලබා ගැනීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:326,480.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, බණ්ඩොක්කයාය ගලමඩ මාර්ගයේ ජලනල ව්‍යාපෘතියක ජලනල ඇතිරීම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ලබා ගැනීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:326,480.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය විසින් සභාගත කරන ලද යෝජනා.</u>

**05.12) නො:1547,ජුලංගැටේ,පදලංගල, ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී පුංචි හේවාගේ සෝමසිරි යන අයගේ නිවසේ වහලය සඳහා සෙවිලි තහඩු 20ක් ලබාදීම වෙනුවෙන් සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය</u>

නො:1547,ජුලංගැටේ,පදලංගල, ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී පුංචි හේවාගේ සෝමසිරි යන අයගේ නිවසේ වහලය සඳහා සෙවිලි තහඩු 20ක් ලබාදීම වෙනුවෙන් සකස් කරන ලද රු:88,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, නො:1547,පූලංගැටේ,පදලංගල, ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී පුංචි හේවාගේ සෝමසිරි යන අයගේ නිවසේ වහලය සඳහා සෙවිලි තහඩු 20ක් ලබාදීම වෙනුවෙන් සකස් කරන ලද රු:88,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**06. හදිසි යෝජනා**

**06.01) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරයේ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය දක්වා මාර්ගයේ සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පනාමුර ආයුර්වේද හා පුස්තකාල භූමියේ ABC ඇතිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරයේ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය දක්වා මාර්ගයේ සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පනාමුර ආයුර්වේද හා පුස්තකාල භූමියේ ABC ඇතිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරයේ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය දක්වා මාර්ගයේ සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු පනාමුර ආයුර්වේද හා පුස්තකාල භූමියේ ABC ඇතිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.02) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථය ජොයින්ට් කුරුස 02 හා රේසර් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථය ජොයින්ට් කුරුස 02 හා රේසර් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LK 9633 අංක දරණ ටිපර් රථය ජොයින්ට් කුරුස 02 හා රේසර් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් තුංකම තාරක පෙර පාසලේ 2021 වර්ෂයේ ඉගෙනුම ලබා විසිර යන පෙර පාසල් දරුවන් 33 දෙනෙකු වෙනුවෙන් ත්‍යාග ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් තුංකම තාරක පෙර පාසලේ 2021 වර්ෂයේ ඉගෙනුම ලබා විසිර යන පෙර පාසල් දරුවන් 33 දෙනෙකු වෙනුවෙන් ත්‍යාග ලබාදීම අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා. කෑම පෙට්ටියක් තමයි ත්‍යාග වශයෙන් ලබා දෙන්නේ.ඒ නිසා සුළු මුදලක් වැය වෙන්නේ.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් තුංකම තාරක පෙර පාසලේ 2021 වර්ෂයේ ඉගෙනුම ලබා විසිර යන පෙර පාසල් දරුවන් 33 දෙනෙකු වෙනුවෙන් ත්‍යාග ( කෑම පෙට්ටි) ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය විසින් සභා ගත කරන ලද යෝජනාව.</u>

**06.04) පදලංගල ධම්මිකා පුණ්‍යාරාම ආරාමයේ බෝධි ප්‍රාකාරය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය</u>

මාගේ කොට්ඨාශයට අයත් පදලංගල ධම්මිකා පුණ්‍යාරාම ආරාමයේ බෝධි ප්‍රාකාරය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, පදලංගල ධම්මිකා පුණ්‍යාරාම ආරාමයේ බෝධි ප්‍රාකාරය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.</u>

**06.05) ජයතිමාපියපුර යුධ හමුදා කඳවුර අසල, ඇලේ වාඩිය බාලමහත්මයාගේ නිවස අසල මාර්ගය, 190m ක පමණ කොටස සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් ජයතිමාපියපුර යුධ හමුදා කඳවුර අසල, ඇලේ වාඩිය බාලමහත්මයාගේ නිවස අසල මාර්ගය, 190m ක පමණ කොටස සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:10,115.00ක ඇස්තමේන්තුව සඳහාත්, අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ජයතිමාපියපුර යුධ හමුදා කඳවුර අසල, ඇලේ වාඩිය බාලමහත්මයාගේ නිවස අසල මාර්ගය, 190m ක පමණ කොටස සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:10,115.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩී.එච්.සීතා පද්මිණී මහත්මිය විසින් සභා ගත කරන ලද යෝජනාව.</u>

**06.06) උඩවලව,තණමල්විල පාර,(වම් අත පැත්ත) වරිපනම් අංක 107 හා 109 වරිපනම් අංක යටතේ වරිපනම් ගෙවනු ලබන අනෝමා නන්දනී අය අයගේ වරිපනම් මුදල් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩී.එච්.සීතා පද්මිණී මහත්මිය</u>

උඩවලව,තණමල්විල පාර,(වම් අත පැත්ත) වරිපනම් අංක 107 හා 109 වරිපනම් අංක යටතේ වරිපනම් ගෙවනු ලබන අනෝමා නන්දනී යන අය දුගී වැන්දඹු කාන්තාවක්.ඇයගේ එකම දරුවා විවාහ වෙලා පිටරට ගිහින්.එම නිසා ඇයට දැන් කිසිම හවු හරණක් නැහැ.මෙම මහත්මිය දැනට තම සහෝදරයාගේ කඩේ කුලී වැඩ කරමින් තමයි ජීවත් වෙන්නේ.මේ හේතුව නිසා ඇයට මෙම වරිපනම් මුදල් ගෙවා ගැනීමට නොහැකි බවත්,එබැවින් එම වරිපනම් මුදල් කපා හරින ලෙස ඉල්ලමින් මා වෙතත් ගරු සභාපතිතුමා වෙතත් ලිපි ඉදිරිපත් කළා. ගරු සභාපතිතුමණි, සභාවේ ආදායම් පරීක්ෂක නිලධාරීන් යොදවා මේ පිළිබඳ සොයා බැලීමෙන් අනතුරුව ඉහත සඳහන් කරන ලද  අනෝමා නන්දනී යන අයගේ වරිපනම් බදු මුදල් කපා හැරීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ගරු සභාපතිතුමණි,ගරු මන්ත්‍රීතුමිය කියන කාරණය ඇත්ත.ඉහත සඳහන් කරන ලද අනෝමා නන්දනී කියන මහත්මිය මටත් ලිපියක් භාර දුන්නා එතුමියට එම වරිපනම් බදු ගෙවා ගන්න බැහැ කියලා.සභාවේ නිලධාරීන් යොදවලා මේ ගැන හොයා බලලා හැකියාවක් තියෙනවා නම් මේ බදු මුදල් කපා හරින්න කියලා ඉල්ලා සිටිනවා.

- **ඒ අනුව, සභාවේ ආදායම් පරීක්ෂක නිලධාරීන් යොදවා මේ පිළිබඳ සොයා බැලීමෙන් අනතුරුව උඩවලව,තණමල්විල පාර,(වම් අත පැත්ත) වරිපනම් අංක 107 හා 109 වරිපනම් අංක යටතේ වරිපනම් ගෙවනු ලබන අනෝමා නන්දනී යන අයගේ වරිපනම් බදු කපා හැරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක්  නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07.කාරක සභා වාර්තා සලකා බැලීම.**

- **2022.03.31 වන දින පැවති මුදල්  හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022.03.31 වන  දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

2022.03.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව  2022.03.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව  සභා සම්මත විය.**

**08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

I. **2022 මාර්තු මස ලැබීම් සාරාංශය.**
II. **2022 මාර්තු මස ගෙවීම් සාරාංශය.**
III. **2022.03.31 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
IV. **2022 මාර්තු මස ලක්ෂ 10ට වැඩි විදයම්.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022 මාර්තු  මාසයට  අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි  මහතා.</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 මාර්තු  මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**09.වෙනත් කරුණු**

නැත.

- **ගරු සභාපති තුමාගේ ස්තූති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පුර්වක ස්තූතිය පුදකර සිටිනවා.

2022.04.11 වන දින පැවති මහ සභාව ප.ව 01.30ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.